**කුලියාපිටිය නගර සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

-------------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 30 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

මුද්දර ගාස්තු ආදායම් ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2004 වර්ෂයේදී රු.91,335 කට මිලදීගෙන තිබුණු තණකොළ කපන යන්ත්‍රය සහිත අත් ට්‍රැක්ටරයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශේෂ ගිණුමේ මුදල් පොතේ ශේෂය රු.11,987,227 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.11,914,628 ක් ලෙස දක්වා තිබුණි.

#### 1.3.3 නොසැසඳුණු ගිණුම්

------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 05 ක මූල්‍ය ප්‍රකාශන හා ලේඛන අනුව පැවති ශේෂ අතර රු.2,832,034 ක වෙනසක් පැවතුණි.

**1.3.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

(අ) ලැබියයුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.90,969,435 ක් වූ ලැබියයුතු ගිණුම්වලින් රු.2,542,066 කට අදාලව කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණු අතර, රුපියල් මිලියන 29.2 ක් වර්ෂයකට වැඩි කාලයක සිට අය නොවී පවතින ශේෂ විය.

(ආ) ගෙවියයුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.71,702,489 ක් වූ ගෙවියයුතු ගිණුම්වලින් රුපියල් මිලියන 10.7 ක් වර්ෂයකට වැඩි කාලයක සිට නිරවුල් නොවී පවතින ශේෂ විය.

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.14,696,284 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| මු.රෙ 571 (1)(2)(3) | 4,413,426 | වර්ෂ දෙකක් ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අයි.ඒ.අයි 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2,545,667 | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.60,375,416ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.56,548,493 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බි ල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගතආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගතආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු. 000. | රු.000 | රු.000 | රු000. | රු.000 |
| (i) වරිපනම් හා බදු | 15,034 | 15,370 | 12,229 | 13,309 | 14,984 | 793 | 16,044 | 11,853 |
| (ii) බදු කුලී | 15,702 | 15,810 | 3,230 | 590 | 14,560 | 14,372 | 9,544 | 3,049 |
| (iii) බලපත්‍ර ගාස්තු | 15,455 | 16,079 | 16,079 | - | 15,478 | 16,224 | 2,092 | - |
| (iv) වෙනත් ආදායම් | 110,722 | 118,105 | 85,160 | 77,070 | 26,357 | 125,939 | 16,980 | 63,066 |
| එකතුව | 156,913 | 165,364 | 116,698 | 90,969 | 71,379 | 157,328 | 44,660 | 77,968 |

සටහන

සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම තුළ ඉකුත් වර්ෂවල හිඟ ලැබීම් රුපියල් මිලියන 08 ක් ඇතුළත්ව තිබුණි.

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සමාලෝචිත වර්ෂයට බිල් කිරීම් රුපියල් මිලියන 165 කින් සහ ඉකුත් වර්ෂවල හිඟ රුපියල් මිලියන 77 කින් සමාලෝචිත වර්ෂයේදී එකතුව රුපියල් මිලියන 116 ක් අයකරගෙන තිබුණි. ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 77 ක් වූ හිඟය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 90 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.8,285,262 ක් වූ වරිපනම් හිඟය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට රු.10,755,408 ක් වී තිබුණි.

(ආ) වරිපනම් ගණනය කිරීම සඳහා සභාව භාවිතා කරන මෘදුකාංගයේ පැවති දුර්වලතා හේතුවෙන් වරිපනම් ලේඛනයේ නොමැති අංකවලට බිල් කිරීම, ලේඛනයේ පවතින අංකවලට බිල් නොකිරීම සහ හිඟ වරිපනම් පිළිබඳ කාල විශ්ලේෂණ ලබා ගැනීමේ අපහසුතා පැවතුණි.

**2.2.4 කුලී**

කුලියට දී තිබුණු සභාව සතු වත්කම් 06 කින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.590,587 ක් අයවීමට තිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් ප්‍රධාන ලේකම්වරයාගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.15,333 ක් හා රු.15,872,720 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් කාරණා 04 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබූ අතර 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් වූ සම්මත අතුරු ව්‍යවස්ථාව සභාව විසින් වැළඳගෙන තිබුණි.

(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2015 වර්ෂයේදී රු.1,500,000 ක් වැයකර ඉදිකර තිබුණු ජල ටැංකියෙන් පල්ලපිටිය පොදු ඉඩමේ නිවාස සඳහා ජලය ලබාදීමට නොහැකි වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා සභා අරමුදල් යටතේ රු.1,051,444 ක් වැයකර ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ඉදිකර තිබුණු විසිරි ජල නළ පද්ධතිය වැඩ නිමකළ 2017 අවසානයේ සිට අක්‍රීයව පැවතුණි.

(ඈ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම
-----------------------------------------------

2016 වර්ෂයේදී රු.1,175,000 ක් වැයකර ප්‍රතිසංස්කරණය කර තිබුණු මල අපද්‍රව්‍ය පිරිපහදු ඒකකය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, ක්‍රියාත්මක වී නොතිබුණි.

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අක්කර 06 ක් වූ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටි ඉඩම සභාවට පවරාගෙන නොතිබුණු අතර, 2016 වර්ෂයේ සිට එහි විවිධ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රු.41,127,295 ක් වැයකර තිබුණි.

(ii) දිනකට එකතු වන ටොන් 07 ක කසළ කළමනාකරණය සඳහා සෞඛ්‍ය කම්කරුවන් 55 දෙනෙකු සේවයේ යොදවා තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් දක්වා කාබනික පොහොර කිලෝ ග්‍රෑම් 106,945 ක් නිෂ්පාදනය කර තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී කසළ කළමනාකරණය සඳහා පුනරාවර්තන වියදම රු.21,825,917 ක් වී තිබුණද, කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රමාණවත් නොවීම, නොදිරන කසල ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ගැටළු, මල අපද්‍රව්‍ය පිරිපහදු ඒකකය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම හා ජීව වායු පද්ධතිය තුළින් ප්‍රමාණවත් ප්‍රයෝජනයක් නොගැනීම යනාදී තත්ත්වයන් පැවතුණි.

(ඉ) පාරිසරික ගැටළු
-------------------

කුලියාපිටිය ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය 2018 මැයි 18 දින පරීක්ෂා කිරීමේදී මධ්‍යස්ථාන භූමියේ ඌරන් මරණ ස්ථානය හා ඒ අවට පරිසරය අධික දුර්ගන්ධයක් සහිත තත්ත්වයෙන් පැවතුණු අතර, අප ජලය හා අපද්‍රව්‍ය ගලා යාමට නිසි කාණු පද්ධතියක් හා වලක් ඉදිකර නොතිබුණි. ගෝඝාතකාගාරයේ මල අපද්‍රව්‍ය පිරිපහදු ඒකකයක් ස්ථාපිත කර තිබුණු අතර, වැසි දිනවලදී පිරිපහදු ටැංකි උතුරා යාම සිදුවෙමින් පැවතුණි.

(ඊ) තිරසර සංවර්ධන ඉලක්ක
-------------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ජන මාධ්‍ය මගින් සභාව දැනුවත්ව තිබුණු අතර තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර චක්‍රලේඛ/ මඟපෙන්වීම් නිකුත් කර නොතිබුණි.

### 3.2 මානව සම්පත් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට තෘතීයික,ද්වීතීයික හා ප්‍රාථමික අංශවල පිළිවෙලින් 01 ක්, 21 ක් හා 19 ක් වශයෙන් පුරප්පාඩුද, ද්විතීයික හා ප්‍රාථමික අංශවල සේවකයින් 20 ක් අතිරික්තවද පැවතුණි.රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 අනුව සේවයේ ස්ථිර කරන ලද 10 දෙනෙකු නිශ්චිත රාජකාරිවල යොදවා නොතිබුණි.

(ආ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව සුදුසුකම් සම්පූර්ණ නොකළ සේවකයින් 06 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබාදී තිබුණි.

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

සභාව සතු කඩ කාමර 229 ක් ගිවිසුම්වලින් තොරව බදුදී තිබුණු අතර වත්කම් 03 ක් සමාලෝචිත වර්ෂයට බදු දී නොතිබුණි.

### 3.4 වත්කම් කළමනාකරණය

#### 3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව වත්කම් විෂයයන් 140 කට අයත් භාණ්ඩ 1,245 ක ප්‍රමාණයක් ලේඛනගත කරනොතිබුණි.

#### 3.4.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

සභාව සතු එකතු වටිනාකම රු.5,806,850 ක් වූ බොබ් කැට් යන්ත්‍රයක් සහ මාර්ග තලනයක් නිසි ආරක්ෂාව තහවුරු නොවූ බාහිර ආයතනවල ගාල්කර තිබුණි.

#### 3.4.3 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

සමාලෝචිත වර්ෂය අවසානයට රු.77,357,900 ක් වූ වත්කම් විෂයයන් 05 ක් හා වටිනාකම සඳහන් නොවූ වත්කම් 01ක්, වර්ෂ 02 සිට වර්ෂ 24 දක්වා කාලයක සිට නිශ්ක්‍රීයව පැවතුණි.

#### 3.4.4 වාර්ෂික භාණ්ඩ/තොග සමීක්ෂණය

භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව තොග පාලනයේදී සිදුවන වැරදි 23 ක් පෙන්වාදී එම වැරදි අවම කර ගැනීම සඳහා යෝජනා 17 ක් ඉදිරිපත් කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**3.5 ආර්ථික නොවූ ගණුදෙනු**

සභාවේ මුරකරුවන් 07 දෙනෙකු සේවයේ නියුක්තව සිටියදී, සභාවට ආරක්ෂක සේවාවක් ලබා ගැනීම වෙනුවෙන් පෞද්ගලික ආරක්ෂක සේවා ආයතනයකට සමාලෝචිත වර්ෂයේදී රු.2,574,414 ක් ගෙවා තිබුණි.

**3.6 වාහන උපයෝජන**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 සැප්තැම්බර් මාසයේදී අක්‍රීය වී තිබුණු කම්පන මාර්ග තලනය අළුත්වැඩියා කිරීම සඳහා යාන්ත්‍රික ඉංජිනේරුගේ නිර්දේශ නොමැතිව අවස්ථා දෙකකදී රු.508,786 ක් ගෙවා තිබුණි. යන්ත්‍ර පැය 40 ක සේවා කාලයකින් පසුව මාර්ග තලනය අක්‍රීය වී තිබුණු අතර, ලියාපදිංචි නොවූ පෞද්ගලික ආයතනයකට රු.1,011,000 ක ඇස්තමේන්තුවකට අළුත්වැඩියාව සඳහා භාරදී තිබුණද, 2018 මැයි 18 දින වන විටද අදාළ උපකරණය ගරාජයක් තුළ කොටස්වලට ගලවා අනාරක්ෂිතව පැවතුණි.

(ආ) සභාව සතු බොබ් කැට් යන්ත්‍රයේ විෂයයන් 13 ක අළුත්වැඩියාවට සමාලෝචිත වර්ෂයේදී යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශ රහිතව රු.317,140 ක් වැයකර තිබුණි. එහෙත් එම අළුත්වැඩියාව නියමිත පරිදි සිදු වී නොතිබුණු බව සඳහන් කරමින් එම යන්ත්‍රය වෙනත් පෞද්ගලික ගරාජයක් වෙත යවා තිබුණි.

**3.7 ප්‍රසම්පාදනය**

**3.7.1 කොන්ත්‍රාත් පරිපාලනය**

රු.2,000,000 ක් වැයකර ඉදිකර තිබුණු සතිපොල තාප්පය හා කඩ කාමරවල වහලය නියමිත ප්‍රමිතියට නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ප්‍රතිපාදන හා තථ්‍ය වියදම අතර වැය විෂයයන් 06 ක සියයට 20 සිට 74 දක්වා විචලනයන් පැවතුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| ------------------- | ------------- |
| (අ) ගිණුම්කරණය | ගිණුම් පොත්පත් හා ලේඛන යාවත්කාලීන නොපැවැත්වීම |
| (ආ) වත්කම්/දේපල පාලනය | (i) ලේඛනගත නොකිරීම.<br>(ii) ආරක්ෂාව තහවුරු නොකිරීම. |
| (ඇ) තොග පාලනය | (i) ලේඛනගත නොකිරීම.<br>(ii) අවිධිමත් තොග පාලනය |
| (ඈ) ණයහිමි/ණයගැති පාලනය | (i) උපලේඛන පිළියෙල නොකිරීම.<br>(ii) කාල විශ්ලේෂණ පිළියෙල නොකිරීම.<br>(iii) දිගු කාලීනව පවතින ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| (ඉ) සේවක කළමනාකරණය | පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම. |
| (ඊ) ව්‍යාපෘති/කොන්ත්‍රාත් | අයවැයගත නොවූ ව්‍යාපෘති සිදු කිරීම. |